HIV හෝ AIDS සම්බන්ධයෙන් පුවත් වාර්තා කිරීමේදී, මාධ්‍යවේදීන් HIV සහ AIDS අතර වෙනස පැහැදිලිව හඳුනාගැනීම අත්‍යවශ්‍ය වේ. HIV යනු වෛරසය වන අතර, AIDS යනු පෙර කී වෛරසය මඟින් ප්‍රතිශක්තිය දුර්වල කිරීම නිසා ඇති වන තත්වය ලෙසින් හඳුනාගත හැක. එනම්, ඒඩ්ස් ආසාදනය නොවන අතර, ආසාදනය වන්නේ එච්.අයි.වී. වෛරසයයි.

මෙසේ HIV සහ AIDS වරදවා වටහා ගනිමින් පුවත් වාර්තා කිරීම ඔස්සේ, එච්.අයි.වී/ඒඩ්ස් සම්බන්ධයෙන් වැරදි වැටහීම් ඇති විය හැක, ඒ ඔස්සේ එච්.අයි.වී/ඒඩ්ස් සම්බන්ධයෙන් සාවද්‍ය මත සමාජගත වීමේ හැකියාවක් ඇත. එසේම, එය HIV හෝ AIDS මර්දනයට පවා බාධාවක් විය හැක.

ඒ අනුව, ටීවී දෙරණ සහ ස්වාධීන රූපවාහිනී පුවත් විකාශයන් ඔස්සේ ඉදිරිපත් වූ මෙම පුවත් කෙතරම් නිරවද්‍ය යැයි ඔබ සිතන්නේ ද?

** අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න!ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!